## වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික - අධි පන්තිය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව: වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමණාකරණ දෙපාර්තමේන්තුව
යොමු අංකය : වෙසං/ පාලන/ බ.ගැ.-2015 දිනය: 2015.09.03

1.2 අමාත්‍යාංශය : මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
යොමු අංකය: 02/02/පා/07/19 දිනය:2015.10.20

1.2 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුර අනුමත කිරීම :
යොමු අංකය: DMS/C1/1/09 දිනය:2012.10.30
DMS/C1/1/09 2013.01.31
DMS/1185 2014.09.18

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :
යොමු අංකය:EST-2/02/REC/0304 දිනය:2015.03.12

1.5 ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය :
යොමු අංකය:NPC/4/1/22/SR-2 දිනය:2015.02.19

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය :
යොමු අංකය:PSC/EST/04-01-30/04/2015 දිනය:2016.02.~~03~~ 02

02. පත්කිරීම් බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

03. සේවා ගණය පිළිබඳ විස්තර

3.1 සේවා ගණය : අධීක්ෂණ කළමනාකරණ සහකාර තාක්ෂණික අධි පන්තිය

3.2 ශ්‍රේණි : විශේෂ ශ්‍රේණිය

3.3 පැවරෙන කාර්යභාරය පිළිබඳ පොදු නිර්වචනය :

අනුමත තනතුරු සංඛ්‍යාවට සීමා වන පරිදි අභ්‍යන්තර බඳවා ගැනීමේ ක්‍රියාවලියක් මගින් බඳවා ගනු ලබන,ජ්‍යෙෂ්ඨ විධායක හා විධායක නිලධාරීන්ගේ කාර්යභාරයට පරිපූරක /සුසාධ්‍යකාරක / උපස්ථම්භක වන පරිදි එම නිලධාරීන්ගේ අධීක්ෂණයට යටත්ව තනතුරු විශේෂිත කොට පවරා දෙනු ලබන පරිපාලනමය/ පිරිස් කළමනාකරණ සහ මූල්‍ය කළමනාකරණ කාර්යයන් පැවරෙන නිලධර ගණයකි.

3.4 කාර්යයන් පැවරීම : මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි/තනතුරු වල ස්වභාවය : ස්ථිර විශ්‍රාම වැටුප් සහිත

05. වැටුප්

5.1 වැටුප් කේත අංකය : MN 7- 2006 (A)

5.2 වැටුප් පරිමාණය : රු. 20,030/= - 11x365- 18x500 – 33,045/=

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු.) |
|---|---|---|
| විශේෂ | පියවර 04 | රු. 21,125/- |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන්

| අනුමත තනතුරු නාම | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|
| ප්‍රධාන වැඩ පරීක්ෂක | 02 | • කාර්මික සහකාර (සිවිල්) නිලධාරීන්ගේ කාර්යයන් පරිපාලනය, මෙහෙයවීම හා අධීක්ෂණය කිරීම .<br>• වෙරළ තීරයේ හා වෙරළ ආරක්ෂක ක්‍රමවේදයන්ගේ සිදුවන වෙනස්වීම් පිළිබඳව සැළකිලිමත් වීම හා ඒ පිළිබඳව අදාළ මාණ්ඩලික ප්‍රධානීන් වෙත වාර්තා කිරීම.<br>• හදිසි ඛාදන තත්ව හා වෙනත් හදිසි ආපදා වලදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව : 2

07. බඳවා ගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | අදාල නොවේ. |
| සීමිත | අදාල නොවේ |
| සේවා පළපුරුද්ද හා කුසලතා | 100% |

සටහන : විශේෂ ශ්‍රේණියට බඳවා ගැනීමේදී පුරප්පාඩු ගණනය කල යුත්තේ ඊට පෙර වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය.

7.2 විවෘත බඳවා ගැනීම : අදාල නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම : අදාල නොවේ.

7.4 සේවා පළපුරුද්ද හා කුසලතාවය මත බඳවා ගැනීම :

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ ශ්‍රේණිය.

7.4.2 සුදුසුකම් :

7.4.2.2 අධ්‍යාපන සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.2 වෘත්තීය සුදුසුකම් : අදාල නොවේ.

7.4.2.3 පළපුරුද්ද : වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කාර්මික සහකාර(සිවිල්/යාන්ත්‍රික) හෝ සැලසුම් ශිල්පී යන තනතුරක I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හය (06)ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා නියමිත වැටුප් වර්ධක හය (06)ම උපයාගෙන තිබීම.

7.4.2.4 කායික සුදුසුකම් : ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.4.2.5 වෙනත් :

I. උසස්කිරීමේ දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
II. අනුමත කාර්යසාධන ඇගැයීමේ පරිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර හය (06)ක් තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්යසාධනයක් පෙන්නුම් කර තිබීම.
III. තෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත්වී තිබීම.
IV. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.4.3 වයස : අදාල නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන සේවා පළපුරුද්ද හා කුසලතාවය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත අදාළ සෙසු අවශ්‍යතාවයන්ද සම්පූර්ණ කර ඇති බවට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සුදුසුකම් පරීක්ෂා කර තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතාවයේ අනුපිළිවෙල මත සහ පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලබයි.

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ.

7.4.4.2 වෘත්තීය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද<br>අදාළ මූලික සුදුසුකම ඉක්මවා සපුරා ඇති සක්‍රිය හා සතුටුදායක සේවා කාලය | 50 | අදාළ නොවේ. |
| කුසලතාවය<br>(අවස්ථානුකූලව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන ලකුණු පරිපාටිය අනුව කුසලතාවය තීරණය කරනු ලැබේ). | 45 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

7.4.4.3.1 ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේදී ඉහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ විස්තරාත්මක ලකුණු පරිපාටිය සකස් කර ඒ සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

7.4.4.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : අදාළ නොවේ (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සුදුසුකම්ද පරීක්ෂා කරනු ලැබේ).

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මඟින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. **කාර්යක්ෂමතා කඩඉම් :** අදාල නොවේ.

09. **භාෂා ප්‍රවීනතාව :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

10. **ශ්‍රේණි උසස් කිරීම් :** අදාල නොවේ.

11. **තනතුරු වලට පත් කිරීම :** අදාල නොවේ.

12. **රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නා වූ කොන්දේසි :** ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවෙහි දැක්වෙන අනෙකුත් පොදු කොන්දේසි අදාළ වේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති වල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ : සක්‍රිය සේවා කාලය

"සක්‍රිය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයන් ඇතුලත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රිය සේවා කාලයක් ලෙස සැළකිය යුතු යැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන්ද ඇතුලත්, නිලධාරියකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය : ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාව අනුව විය යුතුය.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍ර යෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් "රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ."

සකස් කළේ : අත්සන : ............

පරීක්ෂා කළේ : අත්සන : ............
(විෂය භාර මාණ්ඩලික නිලධාරියා)

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ............
(දෙපාර්තමේන්තු ප්‍රධාන)
නම : බී.කේ.ප්‍රභාත් චන්ද්‍රකීර්ති
දිනය : 2016-02-12
තනතුර :

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති
වැ. බ. අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දිනය : 2016.02.12 නිල මුද්‍රාව :

---

යොමු අංකය : 02/02/30/07/19

වෙ. ස. ප. සහ වෙ. සම් කළ. දෙපා. හි ඇඹිලිසන් කළ. ස. තාක්ෂණ අධිකාරී තනතුර සඳහා යෝජිත මෙම බඳවාගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
"සම්පතපාය"
අංක. 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

අත්සන : ............
නම : උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

දිනය : 2016.02. නිල මුද්‍රාව : ............

---

යොමු අංකය : PSC/EST/04-01-30/04/2015

වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ හි ඇඹිලිසන් කළමනාකරණ සහකාර තාක්ෂණ අධිකාරී සඳහා වන මෙම බඳවා ගැනීමේ පරිපාටිය 2016.02.02 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ............
නම : ............
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2016-03-16 නිල මුද්‍රාව : ............



එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05.